# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1977/7 - 2016 ජූලි මස 26 වැනි අඟහරුවාදා - 2016.07.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉඩම් අමා:යොමු අංකය: LD/5/2001/VEP/226.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන *ඉඩමේ/පරවශතාවේ විස්තර* :

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කීරන්තිඩිය සහ කොලහැකඩ ගම්වල පිහිටි කළුතර දිස්ත්‍රික් මැනුම් අධිකාරි විසින් 2015.06.30 වැනි දින මැන පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක ක.4513 හි සඳහන් හෙක්. 2.5000ක් පමණ වූ ඉඩම් කැබැල්ල.

**01. කැබලි අංක 1**

ඉඩමේ නම: පල්ලේගොඩවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි 03ක්, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක්, මිශ්‍ර වගාවන් සහ ගොඩපර කැලය; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් කියන්නා : නමුණුකුල වතු සමාගම ; ප්‍රමාණය: හෙක්. 2.4427.

**02. කැබලි අංක 2**

ඉඩමේ නම: වෙල්බඩ කුඹුර; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් සහ මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් කියන්නා : ඩී. එම්. විමලසේන සහ තවත් අය; ප්‍රමාණය: හෙක්. 0.0151.

**03. කැබලි අංක 3**

ඉඩමේ නම: රාමියවල; විස්තරය: වත්ත, මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් කියන්නා : ඩී. එම්. විමලසේන සහ තවත් අය ; ප්‍රමාණය: හෙක්. 0.0144.

**04. කැබලි අංක 4**

ඉඩමේ නම: වල්මීය ඕවිට; විස්තරය: වත්ත, මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් කියන්නා : ඩී. එම්. විමලසේන සහ තවත් අය ; ප්‍රමාණය: හෙක්. 0.0181.

**05. කැබලි අංක 5**

ඉඩමේ නම: වල්මීය ඕවිට; විස්තරය: වත්ත, මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය : රජය; ප්‍රමාණය: හෙක්. 0.0097.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 අගෝස්තු මස 30 වැනි දින පෙ.ව. 10.00 ට මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2016 අගෝස්තු මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

සුජානි මහේෂා සිල්වා,
ප්‍රාදේශීය ලේකම්,
මතුගම.

2016 ජුනි මස 28 වැනි දින,
මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 199

---

ශුද්ධි පත්‍රිකාවයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : 3/3/27.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 13/97/PI/46.

1999 ජූලි 02 වැනි දින අංක 1086/29 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ **III*** කොටසේ ඉඩම් යටතේ පළකරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වගන්තිය යටතේ අංක 07 - 494 දැන්වීමෙහි (1 ) අ.ග.පි. 1113 අතිරේකය 5 කැබලි අංක 50, 51 (2 ) අ.ග.පි. 1114 අතිරේකය 4 කැබලි අංක 39, 40 (3 ) අ.ග.පි. 1119 අතිරේකය 9 කැබලි අංක 97, 98, 99 (4 ) අ.ග.පි. 1106 අතිරේකය 10 කැබලි අංක 79, 80 සඳහා සඳහන් දිනය ඉවත් කොට ඒ වෙනුවට වෙනත් දිනයක් ආදේශ කිරීමෙන් එම දැන්වීම පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *ඉවත් කළයුතු දිනය* | *ඉවත් කළ දිනය වෙනුවට ආදේශ කළ යුතු දිනය* |
|---|---|
| 1999.08.18 | 2016.09.07 |

එම්. එම්. ඒ. බී. මහවත්ත,
ප්‍රාදේශීය ලේකම්,
මාවතගම.

2016 ජුනි මස 27 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 200

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.